ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
මිල ගණන් කැඳවීමයි

ප්‍රසම්පාදන අංකය - DMC/FIN/2026 (PROCU: 05) Cheque Printing Machine

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය අංශය සඳහා චෙක්පත් මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීම වෙනුවෙන් වන ප්‍රසම්පාදනය සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙතින් මිල ගණන් කැඳවීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කර තිබේ.

ඒ අනුව උක්ත ප්‍රසම්පාදනය සම්බන්ධව ඔබ ආයතනය උනන්දුවක් දක්වන්නේ නම්, මේ සමග අමුණා ඇති පිරිවිතරයන්ට අනුකූලව, ඔබ ආයතනයේ මුද්‍රා තැබූ මිල ගණන් 2026.09.22 වන දින පෙ.ව. 10.30 හෝ ඊට පෙර **“Purchase of Cheque Printing Machine”** යනුවෙන් ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර, **සභාපති - ප්‍රසම්පාදන කමිටුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ප්‍රසම්පාදන ඒකකය, මුදල් අංශය, 3 වන මහළ, විද්‍යා මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් හෝ 03 වන මහලේ, මුදල් අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටිය වෙත ගෙනවිත් බහාලන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

එසේම, ඔබ ආයතනයේ බලයලත් නිළධාරියෙකුගේ අත්සන හා ආයතනයේ නිළ මුද්‍රාව තබා මිල ගණන් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

ප්‍රසම්පාදන කමිටුව
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය,
විද්‍යා මාවත,
කොළඹ 07